




# අච්චු පොත් සුවඳ

පාසලේ පළමුවෙනි ශ්‍රේණියේ සිටම අප අච්චු ගැසූ පාඩම් පොත් භාවිතා කළ ද, ඒ අච්චු පොත්වල නැවුම් සුවඳ සැබෑ ලෙසම ඇඟට දැනෙන්නට පටන් ගත්තේ තුන්වෙනි ශ්‍රේණියේ දී සිට යැයි මට සිතේ.
එයට එක් හේතුවක් වෙන්නට ඇත්තේ පළමුවෙනි සහ දෙවන ශ්‍රේණිවලදී අප භාවිතා කළේ එකම එක අච්චු පොතක් පමණක් වීමයි. මේ පොත් දෙකම අපට සිංහල කියවීම පුරුදු කරන්නට ලියූ පොත් විය.

පළමුවෙනි ශ්‍රේණියේ අප භාවිතා කළ හෝඩි පොතේ දී අපට සාමා සහ අමර හමුවිය. දෙවෙනි ශ්‍රේනියේ පොතේ දී ඔවුන් ගේ කතාවට අමතරව වෙනත් කතන්දර, කවි සහ රචනා ද කියවා ඉගෙන ගන්නට ඉඩ ලැබුණි.

අප ගණං කරන්නටද, ගණං එකතු කරන්නටද, අඩු කරන්නටද මේ කාලය තුල ඉගෙන ගත්තද, ගණිතය සඳහා අච්චු පොතක් ඒ මුල් දෙවසරේ දී භාවිතා නොවීය. අප උගත් ගණිතය සහ වෙනත් විෂය කරුණු කළුලෑල්ලේ සහ ගල්ලෑල්ලේ ලියවී යලි මැකී ගියා පමණි.

සියල්ල වෙනස් වූයේ තුන්වෙනි ශ්‍රේණියේ දී ය. තුන්වෙනි ශ්‍රේණියේ සිට අපට ගල්ලෑල්ල සහ ගල්කූරේ සිට ඇක්සයිස් පොත් සහ පැන්සල් දක්වා ලැබුණු උසස්වීමත් සමගම එතෙක් භාවිතා කළ නිකම්ම නිකං එක් සිංහල පාඩම් පොතක් වෙනුවට අච්චු පොත් ගණනාවක් ම මිළට ගෙන භාවිතා කරන්නට අපට ඉඩ ලැබුණි.

රජයේ විෂයමාලා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලියා පළ කර තිබූ සිංහල, ගණිතය සහ ඉංගිරිසි විෂයන් සඳහා වූ අච්චු පොත්වලට අමතරව ජයසේකර අබේරුවන් ලියූ බුද්ධාගම පොතද, පී. රූබන් පීරිස් ලියූ පරිසරය ආශ්‍රිත ස්වභාව අධ්‍යයනය, ඉතිහාසය, භූගෝලය සහ සෞඛ්‍යය පොත් ද අපට නියම වූ අච්චු පොත් විය. මීට අමතරව පද්‍යා රසය නම් වූ කුඩා කවි පොතද නියම වී තිබුණි.

මේ පොත් සියල්ල අප මිලට ගත්තේ එක්කෝ ගණේමුල්ලේ සීතා ස්ටෝර්සි එකෙනි, නැත්නම් කඩවත මහජන පොත්හලෙනි.

එයිනුත් කඩවත මහජන පොත්හල මගේ සිත් ගත්තේ රුපියල් විසිපහක් වැනි මුදලකට වඩා වටිනා පොත් ඔවුන්ගෙන් මිළදී ගන්නේ නම් අපට වර්ණයෙන් මුද්‍රිත කාලසටහනක් නොමිලේ ලැබෙන නිසාය. ඒ මහජන පොත්හලේ නිල කාලසටහන, නව වසර ඇරඹෙන කාලයේ අප බාටා සපත්තු මිළට ගත් විට ලැබෙන ඔප කඩදසියේ වර්ණයෙන් මුද්‍රිත කාල සටහන තරම්ම අපට අගනා එකක් විය.
ජනවාරියේ නව වසර සඳහා පාසල පටන් ගැනීමට දින කිහිපයකට පෙර අම්මා මා කැටුව අළුත් පොත් ගන්නට මහජන පොත්හලට ගිය හැටි අද ද මගේ මතකයේ හොඳින් රැඳී ඇත.
සිංහල පොත, ගණිතය පොත, ඉංගිරිසි පොත, ජයසේකර අබේරුවන් ගේ බුද්ධාගම පොත සහ පී රූබන් පීරිස් ගේ පොත් හතර ද, අවශ්‍ය තරමට තනිරූල්, කොටුරූල් සහ ඩබල් රූල් පොත් ද, චිත්‍ර ඇඳීමට සුදු කොල සහිත පොතක් ද පමණක් නොව, මේ පොත්වලට කවර දැමීමට බ්‍රව්න් ජේපර් කොල කිහිපයක් ද එහිදී අපි මිළදී ගන්නෙමු.

ඒ සියළු බඩු බාහිරාදිය රැගෙන, ජන්ෂන් හෝටලයෙන් සීනි බනිස් එකක් කා, ප්ලේන් ටී එකක් බී ආපසු බසයේ නිවස බලා එන අතරේ දී මම මගේ අළුත් අච්චු පොත් සිඹ සුවඳ ආඝ්‍රාණය කරමි.

අහා, එවැනි සුවදක්!

ඒ නැවුම් අච්චු පොත් සුවඳ අද ද මගේ නැහැය ඉදිරියේ දැනෙනවා, දැනෙනවා වාගේය.



මෙයින් වසර කිහිපයකට පසුව මා හතේ පන්තියේ ඉගෙන ගන්නා කාලයේ ජීවිතයේ මුල්වරට තුන් මහලින් සැදි කොළඹ ගුනසේන සාප්පුවට ගොඩ වැදී උපන් දින ත්‍යාගයක් ලෙස පොත් රැසක් මිලට ගන්නට වරම් ලැබූ දිනය මගේ සිහියට නැගේ.

එද මට කඩවත නම් වූ නව දැලි හේනත්, මහජන පොත්හල් වැඳිණියත් සිහිවී සිතට මද සිනාවක් නැගුනේ වුවද, ඒ ආකාරයට ගුණසේන පොත් සාප්පුවෙන් මිළට ගත් පොත්වල නම් අර පෙර දිනයක දී මා විඳගත් අළුත් අච්චු පොත්වල තිබූ නැවුම් සුවඳ නම් මට කිසිසේත්ම දැනුනේ නැත.





VCE Excellence –Since 1998

Affordable Private Tutoring for VCE Year 11 & 12
PHYSICS (2014/2015)

10% OFF all group classes when you show this ad

**Small group class for students from Melbourne High School.**
*Physics Unit 1&2 – Saturday 3.30pm, to commence on 23rd November at ecoBright Learning Centre, Tullamarine. Register your interests now as only limited places are available.*

**Email:**
**vce.excellence@gmail.com**
**Or ring Wasantha or Sumudu Perera on 03 93351595(all hrs)**

***Face the challenges of VCE with the best learning strategies and achieve A+ results!***

*Hurry! Very limited places available for Individual tutoring for students in North & North West of Melbourne.*

***CLOSING THE GAP****- A Special Physics and Science Foundation Course to prepare students for the VCE Year 11 Physics. Affordable 3 weeks(6 hours) group class to commence from 23rd Nov at Tullamarine.*

***GAMSAT Science Preparation*** *Classes over 3 weeks in December 2013 at ecoBright Learning Centre, Tullamarine. Email us for more details….*

LANKAN AUTO CARE

Licensed Roadworthy Tester (R.W.C)



ALL MECHANICAL REPAIRS
LOG BOOK SERVICE | ELECTRICAL REPAIRS
AUTO TRANSMISSIONS | BRAKES & CLUTCHES
FUEL INJECTION | COMPUTER DIAGNOSTIC




Ranjith Perera
Mob: 0409 866 886

9798 2200

14/30 Tower Court
Noble Park 3174